**රුහුණ විශ්වවිද්‍යාලය - දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2024 පුනර් පරීක්ෂණය**

රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහත සඳහන් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් දැන් අයදුම්පත් කැඳවනු ලබන අතර **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** 2024.12.31 **දින** වේ.

ලියාපදිංචි කාලසීමාව අවසන් වී ඇති, මෙතෙක් ලියාපදිංචිය දීර්ඝ කරවා නොගත් අපේක්ෂක අපේක්ෂිකාවන් විභාගය අයදුම් කරන අවස්ථාවේ දී තම ලියාපදිංචි කාල සීමාව දීර්ඝ කර ගත යුතු අතර, ඒ සඳහා නියමිත අයදුම්පත් අන්තර්ජාලය මගින් ලබා ගත හැකිය. **ලියාපදිංචිය දීර්ඝ කර නොගන්නා අපේක්ෂක අපේක්ෂිකාවන්හට විභාග ප්‍රවේශ පත්‍ර බාගත කරගැනීමට අවකාශ නොලැබේ.**

ඔබට මේ සමග ඇති ගූගල් ෆෝරමය නිවැරදිව පුරවා අදාළ විභාග ගාස්තු ගෙවන ලද වවුචර්පත්වල ඡායාරූප අදාළ ස්ථානයේ (Upload Voucher) උඩුගත කර විභාගයට අයදුම් කළ හැකි අතර, එසේ සිදුකිරීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ඔබට නොමැති නම් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත හා ගෙවීම් සිදුකළ වවුචර්පත් (කාර්යාලීය පිටපත) 2024.12.31 දින හෝ ඊට පෙර "**නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම හා වර්ෂය සඳහන් කළ යුතුය.**

පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති අපේක්ෂකයන් විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ එවනු ලබන සියලුම අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

පරීක්ෂණයට පෙනී සිටින විෂයයන්, පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

**විභාග ප්‍රවේශ පත්‍ර අන්තර්ජාලය (www.dceu.ruh.ac.lk) මගින් බාගත (Download) කර හැකි අතර. තැපැල් මගින් නිකුත් කරනු නොලැබේ. විභාගයට අදාළ සියළු දැනුම්දීම් මෙම වෙබ් අඩවිය ඔස්සේ සිදුකෙරේ.**

විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත්කර වෛද්‍ය හේතූන් මත ඒ සඳහා පෙනී නොසිටින සිසුන් අදාල වෛද්‍ය සහතිකය, විභාග ප්‍රවේශ පත්‍රය හා වෛද්‍ය සහතික අයදුම්පත්‍රය අදාල විෂය අවසන්ව දින 14 ක් ඇතුලත ඉදිරිපත් කල යුතුය.

අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර අදාළ පරිදි අයදුම්පතේ සඳහන් කළ යුතුය.

**නියමිත විභාග ගාස්තු**

**අසමත් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා** රු. **2,000.00**

**(සැ.යු. : වෛද්‍ය වාර්තා අනුමත වුව ද පෙනී නොසිටි විභාග සඳහා ගෙවීම් සිදුකළ යුතුය.)**

**එක් වර්ෂයක් සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා** රු. **4,000.00**

**පරීක්ෂණ ගාස්තු ගෙවීම**

පහත ආකාර දෙකෙන් එක් ආකාරයකින් සිදු කළ හැකිය.

1. **වවුචර්පත බාගත කර මහජන බැංකුව මගින් ගෙවීම් කිරීම**

ඔබ විසින් බාගත කරනු ලබන වවුචර් පතෙහි කොටස් 03 ම සම්පූර්ණ කර මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් රුහුණ විශ්වවිද්‍යාලයේ රැස් කිරීමේ ගිණුමට වවුචර්පතෙහි ඇති යොමු අංකය හරහා විභාග ගාස්තු ගෙවීම සිදු කොට එහි කාර්යාලීය පිටපත (Office copy) අයදුම්පත්‍රය සමඟ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට ලැබීමට සලස්වන්න. (මුදල් වවුචර්පත බාගත කර ගැනීමේදී) ගෙවීම් කාණ්ඩය ලෙස "විභාග ගාස්තු" තෝරා ගත යුතුය.

2. **මාර්ගගත ගෙවීම (Credit/Debit කාඩ්පත් මගින්)** - මේ සඳහා මාර්ගෝපදේශ අදාළ ඇමුණුම මගින් ලබාගන්න
ගෙවීම් කිරීමෙන් පසු ලැබෙන රිසිට්පත විභාග අයදුම්පත සමග හෝ ගූගල් ෆෝරමය මගින් නම් එහි අදාළ ස්ථානයේ උඩුගත (upload) කරන්න.

**සැළකිය යුතුයි** : ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතිය භාග 2024 පුනර් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා බාහිර විභාග අතුරු ව්‍යවස්ථාව අනුව ඔබ සුදුසුකම් සපුරන්නේ නම් පමණක අදාළ අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. සාවද්‍ය තොරතුරු සහිත අයදුම්පත්‍ර ගාස්තු ගෙවීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රතිපෝෂක දේශණ**

මේ වනවිට ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ද්විතීය භාග පරීක්ෂණවලට අදාළ ප්‍රතිපෝෂණ වැඩසටහන් පසුගිය වසර කිහිපය මුළුල්ලේම පවත්වා ඇති අතර එබැවින් මින් ඉදිරියට ප්‍රතිපෝෂණ දේශණ භෞතිකව හෝ මාර්ගගතව නොපැවැත්වෙන අතර ඒ වෙනුවෙන් විභාග අපේක්ෂකයින් සඳහා ඉගෙනුම් උපකාරකයන් ලෙස Learning Management System (LMS) මගින් පෙර වර්ෂවල පවත්වන ලද ප්‍රතිපෝෂණ දේශණ ගාස්තු ගෙවීමකින් තොරව පරිශීලනය කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.

පී.එම්.එස්.පී. යාපා,
නියෝජ්‍ය ලේඛකාධිකාරී,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය.
රුහුණ විශ්වවිද්‍යාලය
2024.12.02